
# සංවර්ධනාත්මක සන්නිවේදනය



සේන නානායක්කාර

2.23
AN

Rs: 250/-
87393
23 OCT 2017

# සංවර්ධනාත්මක සන්නිවේදනය

RAJMNLIB
87393

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 87393 |
| වර්ග අංකය | 302.23 NAN |

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ආචාර්ය සේන නානායක්කාර
B.A.(Hons.), M.A.(Research), Ph.D.(Mass Comm.)
අංශාධිපති
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

පුස්තකාලය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

# පෙරවදන

මෙම නිබන්ධයෙහි ලා මාතෘකා කොට ගැනුණු සංවර්ධනය හා සංවර්ධනාත්මක සන්නිවේදනය එකිනෙක සම්බන්ධතා ප්‍රකට කරන්නා වූ විෂය පරිශ්‍රයෝ වෙති. එහි පර්යේෂණ ඉතිහාසය ඉතා දිගු ය. එමෙන් ම, මේවා මෑත කාලීන සමාජවිද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රය තුළ වඩාත් ම අවධානයට ලක්කෙරුණු ප්‍රස්තුතයන් වශයෙන් කැපී පෙනේ. ඒ මන්ද යත්, මිනිස් සමාජය පවත්වා ගැනීම හා ප්‍රගමනය කරවීමේ ක්‍රියාවලිය කෙරෙහි ලා පසුබිම් වන්නේ එකී සන්නිවේදනය හා සංවර්ධනය වන බැවිනි. මෙම විෂයද්වය ම එක් සරල සමස්තයකට ගෙන එකිනෙක ගලපාලමින් විදුහුරු විමසුමට ලක්කිරීමෙන් එම විෂය ක්ෂේත්‍රයන්ට අදාළ පර්යේෂණ අවකාශ පුළුල් වීමක් මෙන් ම, ඒ තුළින් සමස්ත මිනිස් සමාජ ප්‍රගමනයෙහි ලා පිටුබල සැපයීමක් ද සිදුවෙනු නිසැක යැයි මම හඟිමි.

එය එසේ අර්ථ දැක්වෙනුයේ, අද්‍යතන සමාජය තුළ වුවද මෙ සම්බන්ධයෙන් ශේෂ ව පවත්නා ගතානුගතික සම්මතයනට ප්‍රබල බුද්ධිමය අභියෝගයක් එතුළින් එල්ල කෙරෙන බැවිනි. කිසියම් සමාජයක් තුළ මුල්බැසගත් ගතානුගතික වූ නිෂ්ඵල සමාජාකල්ප හා චර්යාවන් එකී සමාජයේ ප්‍රගමනය වළක්වාලන ප්‍රමුඛතම දුර්ලක්ෂණය බවට පත්වෙයි. ඌන සංවර්ධිත හෝ සංවර්ධනය වෙමින් පවත්නා රටවල සමාජ උපරි ව්‍යුහය වසා පැතිරගත් ආකල්පමය ව්‍යාජත්වය විසින් එහි අභ්‍යන්තරයෙහි බුබුළු දමන සමාජාර්ථික හා සංස්කෘතිකමය අපගමනය සඟවාලනු ලබයි. එකී ජන සමාජයේ මිනිසුන් ඒ දුර්භාග්‍ය සම්පන්න ඉරණම අත්විඳිමින් සිටින්නේ වුවද, අවම වශයෙන් ඒ පිළිබඳ විමසුම් කරන්නට හෝ නොපෙළැඹෙන්නට තරම් පසුබිම්

සකස් වී ඇත. එබඳු සමාජයන් වෙත නව දැනුම කෘත්‍රිම ව පොම්ප කිරීම වෙනුවට ආකල්පමය වශයෙන් ඔවුන් නිරවද්‍ය පසුබිමකට කැඳවා ගැනීම අත්‍යවශ්‍ය වෙයි.

සංවර්ධනය පිළිබඳ මූලික සාංකල්පික ස්වරූපයේ සිට පූර්ණ සංවර්ධනය දක්වා ත්, සංවර්ධනාත්මක සන්නිවේදනයේ ඓතිහාසික සමාරම්භයේ සිට අති නවීනතම ක්‍රමවේදය දක්වා ත් නිරවද්‍ය නිර්වචනීය විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙකී කෘතියෙහි ප්‍රමුඛතම අධ්‍යාශය කොට ගැනුණි. එහිදී සාම්ප්‍රදායික ව අප උගත් සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ දේශපාලනික වශයෙන් භින්න වූ සංවර්ධනය වෙනුවට, භෞතික හා ආධ්‍යාත්මික මෙන්ම ඊටත් ඔබ්බෙන් වූ, පූර්ණ සංවර්ධනය, පිළිබඳව සරල ව අවධානය යොමුකරන්නට මම පෙළැඹුනෙමි.

දෙවනුව, මෙතෙක් කල් සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය තුළ ප්‍රමුඛත්වයෙහි ලා ගැනුණු හුදු ප්‍රාග්ධනය හා තාක්ෂණයට අමතර ව, ඒ හා ඓන්ද්‍රිය ව බද්ධ කළ යුතු දැනුම් පදනමක් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරේ. ඒ අනුව සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යයෙහි ලා භාවිත කෙරෙන විවිධාකාර වූ ප්‍රවේශයන් කෙරෙහි ඌන පූරණයක් සහිත නව ප්‍රාග්ධන, තාක්ෂණ හා දැනුම් පදනම් ක්‍රමවේදය හඳුන්වාදීම ද මෙ මගින් සිදු කෙරෙයි.

මෙය අංග සම්පූර්ණ සංවර්ධනාත්මක සන්නිවේදන ආකෘතියක් ලෙස හඳුන්වන්නට මම ඉක්මන් නොවෙමි. නමුත්, ප්‍රාග්ධනය හා තාක්ෂණය සහිත පැතිරුණු පුළුල් දැනුම් පදනම තුළ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියෙහි ලා අත්‍යවශ්‍ය සියලු සාධක සපිරෙන බව අවධාරණය කරමි. එය තව දුරටත් විමර්ශනය කළ යුතු ය. සංශෝධනය කළ යුතු ය. ඒ සඳහා මෙකී ක්ෂේත්‍රය ප්‍රස්තුත කොට ගනු ලබන අනාගත පර්යේෂණ විද්‍යාර්ථීන් කෙරෙහි තව තවත් ගවේෂණාත්මක ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමක් මෙතුළින් සිදු වේ නම්, එය ම ප්‍රමාණවත් වේ යැයි මගේ විශ්වාසය යි.

කැලණිය විශ්වවිද්‍යාලයීය දර්ශන විශාරද උපාධිය සඳහා මවිසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධයෙන් උපුටා ගැනුණු පරිච්ඡේද ද්වයක සංශෝධිත කොටස් කිහිපයක් පමණක් මෙහි සංගෘහිත ය.

සකස් වී ඇත. එබඳු සමාජයන් වෙත නව දැනුම කෘත්‍රිම ව පොම්ප කිරීම වෙනුවට ආකල්පමය වශයෙන් ඔවුන් නිරවද්‍ය පසුබිමකට කැඳවා ගැනීම අත්‍යවශ්‍ය වෙයි.

සංවර්ධනය පිළිබඳ මූලික සාංකල්පික ස්වරූපයේ සිට පූර්ණ සංවර්ධනය දක්වා ත්, සංවර්ධනාත්මක සන්නිවේදනයේ ඓතිහාසික සමාරම්භයේ සිට අති නවීනතම ක්‍රමවේදය දක්වා ත් නිරවද්‍ය නිර්වචනීය විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙකී කෘතියෙහි ප්‍රමුඛතම අධ්‍යාශය කොට ගැනුණි. එහිදී සාම්ප්‍රදායික ව අප උගත් සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ දේශපාලනික වශයෙන් හිත්න වූ සංවර්ධනය වෙනුවට, භෞතික හා ආධ්‍යාත්මික මෙන්ම ඊටත් ඔබ්බෙන් වූ, පූර්ණ සංවර්ධනය, පිළිබඳ ව සරල ව අවධානය යොමුකරන්නට මම පෙළැඹුනෙමි.

දෙවනුව, මෙතෙක් කල් සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය තුළ ප්‍රමුඛත්වයෙහි ලා ගැනුණු හුදු ප්‍රාග්ධනය හා තාක්ෂණයට අමතර ව, ඒ හා ඓන්ද්‍රිය ව බද්ධ කළ යුතු දැනුම් පදනමක් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරේ. ඒ අනුව සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යයෙහි ලා භාවිත කෙරෙන විවිධාකාර වූ ප්‍රවේශයන් කෙරෙහි ඌන පූරණයක් සහිත නව ප්‍රාග්ධන, තාක්ෂණ හා දැනුම් පදනම් ක්‍රමවේදය හඳුන්වාදීම ද මෙ මගින් සිදු කෙරෙයි.

මෙය අංග සම්පූර්ණ සංවර්ධනාත්මක සන්නිවේදන ආකෘතියක් ලෙස හඳුන්වන්නට මම ඉක්මන් නොවෙමි. නමුත්, ප්‍රාග්ධනය හා තාක්ෂණය සහිත පැතිරුණු පුළුල් දැනුම් පදනම තුළ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලියෙහි ලා අත්‍යවශ්‍ය සියලු සාධක සපිරෙන බව අවධාරණය කරමි. එය තව දුරටත් විමර්ශනය කළ යුතු ය. සංශෝධනය කළ යුතු ය. ඒ සඳහා මෙකී ක්ෂේත්‍රය ප්‍රස්තුත කොට ගනු ලබන අනාගත පර්යේෂණ විද්‍යාර්ථීන් කෙරෙහි තව තවත් ගවේෂණාත්මක ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමක් මෙතුළින් සිදු වේ නම්, එය ම ප්‍රමාණවත් වේ යැයි මගේ විශ්වාසය යි.

කැලණිය විශ්වවිද්‍යාලයීය දර්ශන විශාරද උපාධිය සඳහා මවිසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධයෙන් උපුටා ගැනුණු පරිච්ඡේද ද්වයක සංශෝධිත කොටස් කිහිපයක් පමණක් මෙහි සංගෘහිත ය.

මෙකී කාර්යභාරයේ සාර්ථකත්වයෙහි ලා පිටුබල සැපයුවෝ බොහෝ වෙති. කැලණිය විශ්වවිද්‍යාලයීය ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ හිටපු ප්‍රමුඛාචාර්ය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් හා මෙහි පසුවදන් සපයමින් මා දිරිමත් කළ ජනසන්නිවේදන අධ්‍යයන අංශාධිපති මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂයෝ ද ඒ අතර ප්‍රමුඛ ය හ.

පිටකවරයෙහි මගේ රුව ආලෝකයෙන් සිත්තම් කළ කැලණිය සරසවි නාට්‍ය, රංගකලා හා ප්‍රතිබිම්බ කලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකරයන්ගේ මිත්‍රත්වය මට මහත් සොම්නස කි. එපමණක් නොව, මෙහි පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැලසුම් කාර්යයෙහි ලා පරිත්‍යාගශීලී වූ පරිගණක තාක්ෂණ උපදේශක පී. එස්. පල්ලියගුරුගේ සොහොයුරා ඇතුළු සමස්ත රජරට සරසවි මිතුරුකැල ද සෙනෙහසින් සමරමි.

ඒ හැර මෙකී සද්කාර්යයෙහි ලා මා වෙත ශක්තිය සැපයූ තවත් සොඳුරු මනුෂ්‍යයින් බොහෝ ය. හුදෙක් නාමමාත්‍රික ව සටහන් කළ ද එය ඉතා දිගු නම් වැලක් වනු නිසැක ය. ඒ සකලවිධ සහෘද සද්ජනයා මා සිත තුළ නිබඳ සම්භාවනයට පත්වෙමින් සිටින අයුරු අතිශයෝක්තියෙන් වැනිය යුතු නැතැයි හඟිමි. ඒ සියලු දෙනාට පිං පතමි.

සේන නානායක්කාර

# පටුන


පිදුම ........................................................ v

පෙරවදන ........................................................ vi

රූප සටහන් නාමාවලිය ........................................................ xii

පළමු පරිච්ඡේදය

1. සංවර්ධනය සම්බන්ධ මූලික අර්ථවිග්‍රහයෙහි ලා එළැඹුම් කිහිපයක් ........................ 15
1.1 සංවර්ධනය : ප්‍රවේශය ........................ 15
1.2 පූර්ව සාංකල්පික පසුබිම ........................ 16
1.3 සංවර්ධනය: සංකල්පයක් ලෙස ........................ 19
1.4 සංවර්ධනය: දේශපාලන දෘෂ්ටියෙන් ........................ 23
1.4.1 නිදහස හා ස්වාධිපත්‍යය ........................ 24
1.4.2 දේශපාලනික විඥානය සහිත සමාජ පෞරුෂය ........................ 25
1.5 සංවර්ධනය පිළිබඳ බෞද්ධ දාර්ශනික චින්තනය ........................ 35
1.6 සංවර්ධනය පිළිබඳ මාක්ස්වාදී දෘෂ්ටිය ........................ 43
1.7 සංවර්ධනය පිළිබඳ සමාජවිද්‍යාත්මක විමසුම ........................ 50
1.7.1 ආගමික ප්‍රවේශය ........................ 52
1.7.2 දාර්ශනික ප්‍රවේශය ........................ 53
1.7.3 මනෝවිද්‍යාත්මක ප්‍රවේශය ........................ 53
1.7.4 තාක්ෂණික ප්‍රවේශය ........................ 53
1.7.5 දේශපාලනික ප්‍රවේශය ........................ 40
1.7.6 සංවර්ධන ප්‍රවේශය ........................ 54
1.7.7 සංවර්ධනය පිළිබඳ වෙබරියානු හා යුග විපරිණාම සංකල්ප සංසන්දනය ........................ 56
1.8 භෞතික, ආධ්‍යාත්මික හා පූර්ණ සංවර්ධනය ........................ 57

දෙවන පරිච්ඡේදය

2. සංවර්ධනාත්මක සන්නිවේදනයः අර්ථ නිරූපණ ....................66
2.1 හැඳින්වීම ....................66
2.2 සංවර්ධන සන්නිවේදනයට ප්‍රවේශයක් ලෙසः සන්නිවේදනය යනු කුමක් ද? ....................67
2.3 සංවර්ධන සන්නිවේදනයः සාංකල්පික ඓතිහාසික පසුබිම ....................69
2.4 සංවර්ධනාත්මක සන්නිවේදනයः සාම්ප්‍රදායයික නිර්වචනීය විග්‍රහය ....................73
2.5 සංවර්ධනාත්මක සන්නිවේදනයः 21 වන සියවසට නව හැඳුනුම්පතක් ....................81
2.5.1 සමාජයීය සක්‍රියභාවය ....................83
2.5.2 තොරතුරු සන්නිවේදනය ....................83
2.5.3 තාක්ෂණ ඵලදායකත්වය ....................89
2.6 සංවර්ධන සන්නිවේදනයේ සුවිශේෂතා ....................90
2.6.1 හුදු ලාභය හා ප්‍රචාරණය බැහැර කිරීම ....................91
2.6.2 මෘදුබව හා සුඛනම්‍ය බව ....................91
2.6.3 යථාර්ථ ඥානය ප්‍රකටකරවීම ....................92
2.6.4 අභිප්‍රේරණාත්මක අධ්‍යාශය ....................92
2.6.5 ව්‍යවහාරාභිමුඛවීම ....................93
2.6.6 තුන්වන ලෝකයේ උපත ලද්දක් වීම ....................95
2.6.7 නිශ්චිත අරමුණු සහිත මානවහිතවාදී බව ....................95
2.7 සංවර්ධනාත්මක සන්නිවේදනයේ අරමුණු හා කාර්යභාරයන් ....................97
2.7.1 නව දැනුම හා නව ආකල්ප වඩවාලීම ....................97
2.7.2 ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරවීම ....................99
2.7.3 නව හැකියා වර්ධනයට රුකුල් දීම ....................100
2.7.4 ජන සහභාගීත්වයෙහි ලා ප්‍රජාව පෙළඹවීම ....................100
2.7.5 ජාතික සමගිය හා ඒකාග්‍රතාව ගොඩනැගීමට රුකුල් දීම ....................101
2.7.6 අන්තර් සම්බන්ධතා තහවුරුව 101

| | | |
|---|---|---|
| 2.8. | සංවර්ධනාත්මක සන්නිවේදනයේ අභියෝගයන් ............ | 103 |
| 2.8.1 | සාංකල්පික අභියෝග ............ | 103 |
| 2.8.2 | යටත් විජිතවාදයේ අතුරු ප්‍රතිඵල ............ | 106 |
| 2.8.3 | ප්‍රාග්ධනය හා තාක්ෂණය හිඟකම ............ | 107 |
| 2.8.4 | පරාධීන මානසිකත්වය හා බැදෙන චර්යා ............ | 108 |
| 2.9 | සංවර්ධනාත්මක සන්නිවේදනයේ විධිනියම හා ක්‍රමෝපායයන් ............ | 110 |
| 2.9.1 | ග්‍රාහක කේන්ද්‍රීය හා සහභාගිත්ව ප්‍රවේශය ............ | 110 |
| 2.9.2 | අභ්‍යන්තර ප්‍රභව ප්‍රවේශය ............ | 113 |
| 2.9.3 | සමීපස්ථ ප්‍රවේශය ............ | 116 |
| 2.9.4 | සාම්ප්‍රදායික (ගැමි මාධ්‍ය) ප්‍රවේශය ............ | 119 |
| 2.9.5 | පොදු කරුණු ............ | 124 |
| 2.10 | නව-ප්‍රාග්ධන, තාක්ෂණ හා දැනුම් පදනම් න්‍යාය ............ | 125 |